22.07.2016

REFERENCE ONLY

මීගමුව අධ්‍යාපන කලාපය

**දෙවන වාර ඇගයීම - 2016**

**පුරවැසි අධ්‍යාපනය I , II**

විභාග අංකය: ..............................

කාලය පැය 03 යි.

| 11 ශ්‍රේණිය | I කොටස |
| --- | --- |

**උපදෙස්**

- සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරන්න.

01. "ප්‍රජාතන්ත්‍රවාදය යනු සියලු දෙනාටම අයිතිවාසිකම් හිමිවන පාලන ක්‍රමයයි" යන ප්‍රකාශය කරන ලද්දේ,
    (1) ඒබ්‍රහම් ලින්කන් විසිනි. (2) සීලර් විසිනි.
    (3) ජී.ඩී.එච්. කෝල් විසිනි. (4) ටී.බී ටයිලර් විසිනි

02. ඒක පක්ෂ ක්‍රමය ක්‍රියාත්මක වන රටකි.
    (1) චීනය (2) මහා බ්‍රිතාන්‍ය
    (3) ඇමරිකා එක්සත් ජනපදය (4) ඉන්දියාව

03. ශ්‍රී ලංකාවේ ඡන්ද කොට්ඨාස බෙදා වෙන් කිරීම සඳහා යොදා ගන්නා ප්‍රධාන නිර්ණායක 02 වනුයේ,
    (1) භූමිය හා ආගමයි. (2) භූමිය හා වයස් සීමාවයි.
    (3) භූමිය හා ජනවර්ගයයි. (4) භූමිය හා ජනගහනයයි.

04. නිදහස් හා සාධාරණ මැතිවරණයක ලක්ෂණයක් නොවන්නේ මින් කුමන ප්‍රකාශය ද?
    (1) නියමිත කාල සීමාව තුළ මැතිවරණ පැවැත්වීම.
    (2) මැතිවරණ නීති රීතිවලට අනුකූලව මැතිවරණ පැවැත්වීම.
    (3) නිදහසේ මැතිවරණ කටයුතුවලට සහභාගී වීමට ඇති අයිතිය තහවුරු වී නොතිබීම.
    (4) සාමකාමී වාතාවරණයක් තුළ මැතිවරණ පැවැත්වීම.

05. ආණ්ඩුව සමන්විත වන ප්‍රධාන ආයතනයකි.
    (1) ව්‍යවස්ථාදායකය. (2) ජනාධිපති ලේකම් කාර්යාලය.
    (3) දිසා අධිකරණය. (4) ප්‍රාදේශීය ලේකම් කාර්යාලය.

06. ජනාධිපති ආණ්ඩුක්‍රමයක් සම්බන්ධයෙන් නිවැරදි ප්‍රකාශය වනුයේ කුමක් ද?
    (1) රාජ්‍යයේ නායකයා අගමැතිවරයා වන අතර ආණ්ඩුවේ නායකයා වන්නේ ජනාධිපතිවරයායි.
    (2) විධායකය, ව්‍යවස්ථාදායකයට වගකීමට සෘජුව බැඳී ඇත.
    (3) ව්‍යවස්ථාදායකය මගින් සෘජුව විධායකය පාලනය කරයි.
    (4) විධායකයේ බලය හසුරුවන්නේ ජනාධිපතිවරයා විසිනි.

07. පාර්ලිමේන්තු ආණ්ඩුක්‍රමයක දේශපාලන විධායකය වනුයේ,
    (1) ජනාධිපති ප්‍රමුඛ කැබිනට් මණ්ඩලයයි. (2) ජනාධිපති ප්‍රමුඛ මන්ත්‍රී මණ්ඩලයයි.
    (3) අගමැති ප්‍රමුඛ කැබිනට් මණ්ඩලයයි. (4) අගමැති ප්‍රමුඛ මන්ත්‍රී මණ්ඩලයයි.

08. රටතුළ ක්‍රියාත්මක වන ප්‍රාදේශීය ආණ්ඩු කැන්ටන් ලෙස හඳුන්වනු ලබන රට වනුයේ,
    (1) ඔස්ට්‍රේලියාවයි. (2) ප්‍රංශයයි.
    (3) ඉන්දියාවයි. (4) ස්විට්සර්ලන්තයයි.

09. ඒකීය ආණ්ඩු ක්‍රමයක් පවතින රටක් වනුයේ,
(1) ශ්‍රී ලංකාවයි. (2) ස්විට්සර්ලන්තයයි.
(3) ඉන්දියාවයි. (4) ඇමරිකා එක්සත් ජනපදයි.

10. ශ්‍රී ලංකාවේ මධ්‍යම පළාතට අයත් වන දිස්ත්‍රික්කයකි,
(1) කෑගල්ල දිස්ත්‍රික්කය. (2) බදුල්ල දිස්ත්‍රික්කය.
(3) මාතලේ දිස්ත්‍රික්කය. (4) රත්නපුර දිස්ත්‍රික්කය.

11. මධ්‍යම ආණ්ඩුවට හා පළාත් සභාව යන ආයතන දෙවර්ගයට ම සමසේ භුක්ති විඳිය හැකි බලතල අයත් ලැයිස්තුව වනුයේ,
(1) පළාත් සභා ලැයිස්තුවයි. (2) සංවෘත ලැයිස්තුවයි.
(3) සමගාමී ලැයිස්තුවයි. (4) සමගාමී හා සංවෘත ලැයිස්තුවයි.

12. ඇමරිකා එක්සත් ජනපදයේ මධ්‍යම ආණ්ඩුව සතු බලතලයක් වනුයේ,
(1) බදු පැනවීම හා රැස්කිරීමයි. (2) අධ්‍යාපනය හා සෞඛ්‍යයයි.
(3) සෞඛ්‍යයයි. (4) පළාත් පාලනයයි.

13. ධනවාදී අර්ථ ක්‍රමයක ලක්ෂණයක් වනුයේ මින් කුමක් ද?
(1) දේපල අයිතිය රජය සතුවීම.
(2) ලාභය උපරිම කරගෙන නිෂ්පාදනය සිදු වීම.
(3) මධ්‍ය සැලසුම් මණ්ඩලයක් මගින් ආර්ථිකය මෙහෙය වීම.
(4) මූලික ආර්ථික ප්‍රශ්න විසඳීමේ දී පොදු යහපත උදෙසා කටයුතු කිරීම.

14. සමාජවාදී වෙළෙඳපොළ ලක්ෂණ වැඩි වශයෙන් දක්නට ලැබෙන රටවල් පමණක් අයත් පිළිතුර වනුයේ,
(1) උතුරු කොරියාව හා කියුබාවයි. (2) ඕස්ට්‍රේලියාව හා දකුණු කොරියාවයි.
(3) ඇමරිකා එක්සත් ජනපදය හා ඕස්ට්‍රේලියාවයි. (4) සිංගප්පූරුව හා කොරියාවයි.

15. 2012 දී මානව සංවර්ධන දර්ශකය අනුව ශ්‍රී ලංකාව හිමිකර ගත් ස්ථානය වනුයේ,
(1) 102 වන ස්ථානයයි. (2) 97 වන ස්ථානයයි.
(3) 92 වන ස්ථානයයි. (4) 91 වන ස්ථානයයි.

16. 1977 න් පසු ශ්‍රී ලංකා ආර්ථිකය සම්බන්ධයෙන් නිවැරදි ප්‍රකාශයක් වනුයේ,
(1) ආනයන ආදේශන කර්මාන්ත ඇරඹීමයි. (2) විවෘත ආර්ථික ප්‍රතිපත්ති හඳුන්වා දීමයි.
(3) විනිමය පාලන නීති රීති දැඩි කිරීමයි. (4) පළාත් ක්‍රමයක් ක්‍රියාත්මක කිරීමයි.

17. (BIMSTEC) බෙංගාල මුහුදු තීරය අවට රටවල් පිහිටුවා ගත් ආර්ථික සහයෝගිතා සංගමයට අයත් රටවල් පමණක් ඇතුළත් පිළිතුර වනුයේ,
(1) පකිස්ථානය, ශ්‍රී ලංකාව, ඉන්දියාව, ඇෆ්ගනිස්ථානය සහ නේපාලයයි.
(2) ශ්‍රී ලංකාව, බංගලිදේශය, නේපාලය, භූතානය සහ ඉන්දියාවයි.
(3) මැලේසියාව, බංගලිදේශය, නේපාලය, භූතානය සහ ඉන්දියාවයි.
(4) බංගලිදේශය, ඉන්දියාව, මියන්මාරය, ශ්‍රී ලංකාව සහ තායිලන්තයයි.

18. ඊශ්‍රායල හා පලස්තින ගැටුම,
(1) වාර්ගිකත්වය මත පදනම් වූවකි. (2) දේශ සීමා මත පදනම් වූවකි.
(3) සමාජ ආර්ථික ගැටලු මත පදනම් වූවකි. (4) ආගමික මතවාද මත පදනම් වූවකි.

19. මනසේ සාමය ඇතිකර ගැනීම සඳහා යොමු විය හැකි අංශයකි.
(1) ආගමික වතාවත් කෙරේ යොමු වීම. (2) ත්‍රාසජනක හෝ හාස්‍ය ජනක චිත්‍රපටි නැරඹීම
(3) අපේක්ෂාභංගත්වයට පත්වීම. (4) සතුරු ආකල්ප ඇති කර ගැනීම

20. "නීතිය යනු රාජ්‍ය විසින් ක්‍රියාවට නංවනු ලබන අයිතිවාසිකම් හා බැඳීම් පිළිබඳ පද්ධතියකි." මෙම නිර්වචනය ඉදිරිපත් කර ඇත්තේ,
   (1) ජෝන් ඔස්ටින් විසිනි. (2) ටී.එච් ග්‍රීන් විසිනි.
   (3) ඒ.වී. ඩයිසි විසිනි. (4) සී.එන්. ස්ට්‍රොන්ග් විසිනි.

21. තේසවලාමේ නීතිය,
   (1) උතුරු පළාතේ හා මන්නාරම් දිස්ත්‍රික්කයේ පදිංචි දෙමළ වැසියන්ට සීමා වී තිබේ.
   (2) උඩරට පදිංචි සිංහල වැසියන්ට පමණක් ක්‍රියාත්මක වේ.
   (3) වතුකරයේ සිටින ද්‍රවිඩ වැසියන්ට පමණක් සීමා වීම.
   (4) ඉස්ලාම් ආගම අදහන අයට පමණක් සීමාවේ.

22. ශ්‍රී ලංකාවේ අවසාන හා ඉහළම අභියාචනාධිකරණ බලය සහිත උපරිමාධිකරණය වනුයේ,
   (1) අභියාචනාධිකරණය යි. (2) ශ්‍රේෂ්ඨාධිකරණය යි.
   (3) පළාත් බද මහාධිකරණය යි. (4) දිසා අධිකරණය යි.

23. පාර්ලිමේන්තු කටයුතු කොමසාරිස් (ඔම්බුඩ්ස්මන්) ධූරය ඇති කරන ලද්දේ,
   (1) 1931 ඩොනමෝර් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ මගිනි.
   (2) 1947 සෝල්බරි ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ මගිනි.
   (3) 1972 ශ්‍රී ලංකා පළමු ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගිනි.
   (4) 1978 ශ්‍රී ලංකා දෙවන ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගිනි.

24. එක්සත් ජාතීන්ගේ ළමා අයිතිවාසිකම් පිළිබඳ සම්මුතියට අනුව ළමයෙකු ලෙස සලකන්නේ,
   (1) අවු. 12 ට අඩු ඕනෑම මනුෂ්‍යයෙකි. (2) අවු. 14 ට අඩු ඕනෑම මනුෂ්‍යයෙකි.
   (3) අවු. 16 ට අඩු ඕනෑම මනුෂ්‍යයෙකි. (4) අවු. 18 ට අඩු ඕනෑම මනුෂ්‍යයෙකි.

25. රටක උත්තරීතර නීතිය වනුයේ,
   (1) දණ්ඩ නීති සංග්‍රහයයි. (2) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවයි.
   (3) අපරාධ නීතියයි. (4) සිවිල් නීතියයි.

26. අපරාධ නීතියට අනුව දඬුවම් ලැබිය හැකි බරපතල වරදකි.
   (1) පවුල් ආරවුල් (2) ගිවිසුම් සම්බන්ධ ගැටලු
   (3) ඉඩම් සම්බන්ධ ගැටලු (4) මත්ද්‍රව්‍ය ළඟ තබා ගැනීම හා අලෙවිය

27. ඔම්බුඩ්ස්මන්වරයාගෙන් අපේක්ෂා කරන ප්‍රධාන කාර්යයන් වනුයේ,
   (1) නීති රීතිවලට අනුකූලව මැතිවරණ පැවැත්වීමයි.
   (2) සියලු පුරවැසියන්ගේ මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වීම වැළැක්වීමයි.
   (3) මානව හිමිකම් පිළිබඳව මහජනතාව දැනුවත් කිරීමයි.
   (4) කාන්තා අයිතිවාසිකම් පිළිබඳව මහජනතාව දැනුවත් කිරීමයි.

28. නීතියේ ආධිපත්‍ය තහවුරු වී තිබෙන සමාජගත දැකිය හැකි ලක්ෂණයන් වනුයේ,
   (1) නීතිය නොදැන සිටීම නිදහසට කරුණක් වීමයි.
   (2) පුද්ගලයාගේ තරාතිරම අනුව නීතිය ක්‍රියාත්මක වීමයි.
   (3) නීතිය ඉදිරියේ සෑම දෙනාම සමාන පුද්ගලයන් සේ සැලකීමයි.
   (4) විනිශ්චයකාරවරුන්ට තම තීන්දු ගැනීමට බලපෑම් සිදු කිරීමයි.

29. අප්‍රමාදව හා අපක්ෂපාතීව යුක්තිය පසිඳලීම වැදගත් වනුයේ,
   (1) පුද්ගලයන් තුළ අධිකරණ පද්ධතිය හා නීතිය පිළිබඳ විශ්වාසය ඇති වීම සඳහායි.
   (2) යුක්තිය ඉටු කර ගැනීම සඳහා අතියම් ක්‍රම භාවිතය ඉහළ නැංවීම සඳහායි.
   (3) නීතිය වෙනුවට අවනීතිය ඉදිරියට ඒම සඳහායි.
   (4) පාලන පක්ෂයේ ජනප්‍රිය භාවය ඉහළ නැංවීම සඳහායි.

30. ශ්‍රී ලංකිකයන්ට සර්ව ජන ඡන්දබලය ලැබුණේ කුමන ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ මගින් ද?
(1) 1920 - කෲව් මැකලම් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ මගිනි.
(2) 1921 - මැනිං ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ මගිනි.
(3) 1931 - ඩොනමෝර් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණය මගිනි.
(4) 1947 - සෝල්බරි ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණය මගිනි.

31. ශ්‍රී ලංකාව ස්වාධීන ජනරජයක් බවට පත් වූ වර්ෂය වනුයේ,
(1) 1948 ය. (2) 1972 ය.
(3) 1977 ය. (4) 1978 ය.

32. ශ්‍රී ලංකාවේ පවතින මහ නගර සභා සංඛ්‍යාව,
(1) 09 කි. (2) 23 කි.
(3) 24 කි. (4) 25 කි.

33. පළාත් පාලන ආයතන සඳහා නියෝජිතයන් තෝරා පත් කර ගන්නා කාල සීමාව වනුයේ,
(1) වසර 4 කි. (2) වසර 5 කි.
(3) වසර 6 කි. (4) වසර 10 කි.

34. 1978 දෙවන ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනුව විධායකයේ ප්‍රධානියා වනුයේ,
(1) අගවිනිසුරු ය. (2) ජනාධිපති ය.
(3) අගමැති ය. (4) කථානායක ය.

35. ව්‍යවස්ථාදායකය සඳහා ජාතික ලැයිස්තුවෙන් තෝරා පත් වන මන්ත්‍රී සංඛ්‍යාව වනුයේ,
(1) 22 කි. (2) 25 කි.
(3) 27 කි. (4) 29 කි.

36. පුරපති හෙවත් නගරාධිපති,
(1) පළාත් සභාවේ ප්‍රධානියා වේ.
(2) මහ නගර සභාවේ ප්‍රධානියා වේ.
(3) ප්‍රාදේශීය සභාවේ ප්‍රධානියා වේ.
(4) නගර සභාවේ ප්‍රධානියා වේ.

37. එක්සත් ජාතීන්ගේ මානව අයිතිවාසිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනය පුර්විකාව සහ වගන්ති
(1) 20 කින් සමන්විත වේ.
(2) 25 කින් සමන්විත වේ.
(3) 30 කින් සමන්විත වේ.
(4) 40 කින් සමන්විත වේ.

38. ශ්‍රී ලංකාව කාන්තාවන්ගේ මානව අයිතිවාසිකම් සුරක්ෂිත කිරීම සඳහා ගත් ක්‍රියා මාර්ගයක් පිළිබඳ නිවැරදි ප්‍රකාශය වනුයේ,
(1) කාන්තා කටයුතු ආපදා කළමනාකරණ අමාත්‍යාංශයට පැවරීමයි.
(2) සෑම පොලිසියකම ළමා හා කාන්තා අංශයන් පිහිටු වීමයි.
(3) කාන්තාවන්ට එරෙහිව සිදු කරන වැරදි සිවිල් නීතියට පමණක් සීමා වීමයි.
(4) ජාතික කාන්තා කමිටුව ස්වයං රැකියා සඳහා ණය ලබා දීමයි.

22-07-2016
11 ශ්‍රේණිය
පුරවැසි

REFERENCE ONLY

39. පහත "අ" තීරුවේ සඳහන් ප්‍රකාශය "ආ" තීරුවේ ප්‍රකාශය සමඟ නිවැරදිව ගැළපූ විට අදාළ පිළිතුර ඇතුළත් කාණ්ඩය තෝරන්න.

| "අ" තීරුව | | "ආ" තීරුව | |
|---|---|---|---|
| 1. | වතු කම්කරු ආරවුල් | A | සමථකරණය |
| 2. | ජාතීන් අතර පවතින ගැටුම් | B | බේරුම් කිරීම |
| 3. | පවුල් ආරවුල් | C | සහමන්ත්‍රණය හා සේවල් කිරීම |
| 4. | සේවක වැටුප් හා අයිතිවාසිකම් | D | මැදිහත්කරණය |
| | | E | විනිසීම |

1. C D A සහ B ය.
2. A C B සහ D ය.
3. B C A සහ D ය.
4. C A D සහ E ය.

40. පහත දක්වෙන කරුණු අතුරෙන් දිසා අධිකරණයට විසඳිය හැකි නඩු ඇතුළත් පිළිතුර වනුයේ.

A රාජ්‍ය විරෝධී ක්‍රියා

B විවාහ සම්බන්ධ ගැටලු

C රජයේ සේවකයන් සම්බන්ධ වැරදි

D උප්පැන්න සහතිකයේ නම වෙනස් කිරීම සඳහා කරන ඉල්ලීම

(1) A හා C ය.
(2) A හා B ය.
(3) B හා D ය.
(4) A හා D ය.

මීගමුව අධ්‍යාපන කලාපය
**දෙවන වාර ඇගයීම - 2016**
**පුරවැසි අධ්‍යාපනය I , II**

විභාග අංකය: ..............................................

| 11 ශ්‍රේණිය | II කොටස |
|---|---|

**උපදෙස්**

- පළමු ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න 04 ක් ඇතුලුව ප්‍රශ්න 5 කට පිළිතුරු සපයන්න.

01. i. ප්‍රජාතන්ත්‍රවාදී පාලනයේ ස්වරූප දෙක නම් කරන්න.

ii. තරගකාරී පක්ෂ ක්‍රමයක යහපත් ලක්ෂණ දෙකක් ලියන්න.

iii. ජාතික රාජ්‍යයක ප්‍රධාන ලක්ෂණ දෙකක් ලියන්න.

iv. ශ්‍රී ලංකාවේ පළාත් දෙකක් නම් කරන්න.

v. බහු සංස්කෘතික සමාජයක යහ පැවැත්ම සඳහා පුරවැසියකු ප්‍රගුණ කළ යුතු ගුණාංග දෙකක් ලියන්න.

vi. මූලික ආර්ථික ප්‍රශ්න දෙකක් ලියා දක්වන්න.

vii. තිරසාර සංවර්ධනයේ දී සැලකිය යුතු කරුණු දෙකක් ලියන්න.

viii. ශ්‍රේෂ්ඨාධිකරණය සතු අධිකරණ බලතල දෙකක් ලියන්න.

ix. 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව ජනාධිපතිවරයා සතු ව්‍යවස්ථාදායක බලතල 2 ක් ලියන්න.

x. නීතිපතිතුමාගේ බලතල හා කාර්යයන් ඉටු කිරීමට සහය වන නිලධාරීන් දෙදෙනෙකු නම් කරන්න.

(ල. 2 X 10 = 20 යි)

02. i. නූතන රාජ්‍යයන්හි මූලික වශයෙන් දැකිය හැකි ආණ්ඩු ක්‍රම 02 ක් නම් කරන්න.

(ල. 02 යි)

ii. ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමයක් සාර්ථක වීමට බලපාන සාධක 03 ක් ලියා දක්වන්න.

(ල. 03 යි)

iii. ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමය වැදගත් වීමට හේතු තුනක් සඳහන් කර ඉන් එකක් කෙටියෙන් විස්තර කරන්න.

(කරුණු 3 ට ලකුණු 03 යි, විස්තරයට ලකුණු 02 යි)

මුළු ලකුණු 10 යි

22.06.2016
11 ශ්‍රේණිය පුරවැසි

REFERENCE
ONLY

03. i. තිරසාර සංවර්ධනය ලෙස හඳුන්වන්නේ කුමක් ද? (ල. 02 යි)

ii. 21 වන සියවස වන විට ශ්‍රී ලංකා ආර්ථිකයේ දැකිය හැකි නව සංවර්ධන ප්‍රවණතා 03ක් ලියා දක්වන්න. (ල. 03 යි)

iii. ගෝලීයකරණය ශ්‍රී ලංකා ආර්ථිකයට සිදු කරන ධනාත්මක බලපෑම් 3ක් සඳහන් කර ඉන් එකක් කෙටියෙන් විස්තර කරන්න.

(කරුණු 3 ට ලකුණු 03, විස්තරයට ලකුණු 02 යි)
මුළු ලකුණු 10 යි

04. i. යහපාලනයක් යනුවෙන් අදහස් වන්නේ කුමක් ද? (ල. 02 යි)

ii. බහු සංස්කෘතික සමාජයක මූලික ලක්ෂණ 03ක් ලියා දක්වන්න. (ල. 03 යි)

iii. බහු සංස්කෘතික සමාජයක යහපැවැත්ම උදෙසා පුරවැසියා ප්‍රගුණ කළ යුතු ගුණාංග තුනක් දක්වා ඉන් එකක් පැහැදිලි කරන්න.

(කරුණු 3 ට ලකුණු 03, විස්තරයට ලකුණු 02 යි)
මුළු ලකුණු 10 යි

05. i. නීති මූලාශ්‍ර 02ක් නම් කරන්න. (ල. 02 යි)

ii. ශ්‍රී ලංකා අධිකරණ කටයුතු හා නීතිය පිළිබඳව ඉහළ ම තලයේ සිටින ප්‍රධාන නිළධාරීන් තිදෙනා නම් කරන්න. (ල. 03 යි)

iii. අධිකරණයේ ස්වාධීනත්වය ආරක්ෂා කිරීම සඳහා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ඇතුළත් කර ඇති ප්‍රතිපාදන 03ක් නම් කර ඉන් එකක් කෙටියෙන් පැහැදිලි කරන්න.

(කරුණු 3 ට ලකුණු 03, විස්තරයට ලකුණු 02 යි)
මුළු ලකුණු 10 යි

06. i. 1978 ශ්‍රී ලංකා දෙවන ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ප්‍රතිඵල 02ක් ලියන්න. (ල. 02 යි)

ii. ශ්‍රී ලංකාවේ ප්‍රාදේශීය ඒකක වලට බලය විමධ්‍යගත කිරීමට බලපෑ හේතු 03ක් ලියා දක්වන්න. (ල. 03 යි)

iii. ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක වන පළාත් පාලන ආයතන තුන නම් කර ඉන් එකක් කෙටියෙන් විස්තර කරන්න.

(කරුණු 3 ට ලකුණු 03, විස්තරයට ලකුණු 02 යි)
මුළු ලකුණු 10 යි

07. i. පුද්ගලයෙකු සතු සිවිල් අයිතිවාසිකම් 02ක් ලියා දක්වන්න. (ල. 02 යි)

ii. ළමා අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකාව ගෙන ඇති ක්‍රියාමාර්ග 03 ක් නම් කරන්න. (ල. 03 යි)

iii. ශ්‍රී ලංකාවේ වැඩිහිටියන්ගේ අයිතිවාසිකම් සුරක්ෂිත කිරීම සඳහා රජය අනුගමනය කරන ක්‍රියාමාර්ග පිළිබඳ කරුණු 03ක් දක්වා ඉන් එකක් කෙටියෙන් පැහැදිලි කරන්න.

(කරුණු 3 ට ලකුණු 03 යි, විස්තරයට ලකුණු 02 යි)
මුළු ලකුණු 10 යි